ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.07.16 චක්‍රලේඛ අංක 59/2026

සියළු ම දිසා කොමසාරිස්වරුන් හා
සියළු ම ජනාධිපති බාලදක්ෂ ප්‍රදානලාභීන් වෙත,

ජනාධිපති ප්‍රදානය සමත්වීමේ ලිපි පිරිනැමීම සහ පදක්කම් පැළඳවීමේ උත්සවය -2026

ජනාධිපති ප්‍රදානය සමත්වූ බාලදක්ෂයන් සඳහා සමත්වීමේ ලිපි පිරිනැමීම හා පදක්කම් පැළඳවීමේ උත්සවය 2026 අගෝස්තු මස 01 වන සෙනසුරාදා දින ජාතික බාලදක්ෂ මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී (65/9, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02) පැවැත් වේ. එදිනට අංග සම්පූර්ණ නිල ඇඳුමින් බාලදක්ෂයින් නියමිත වේලාවට වාර්තා කිරීම අත්‍යවශ්‍ය වේ.

ජනාධිපති ප්‍රදානය සමත්වූවන්ගේ ලේඛනය

ඔබගේ පහසුව සහ බාලදක්ෂයන් දැනුම්වත් කිරීම පිණිස මෙම ප්‍රදානෝත්සවය සඳහා සුදුසුකම් සහිත ඔබ දිසාවෙහි ජනාධිපති ප්‍රදානය දිනාගත් ප්‍රදානලාභීන්ගේ ලේඛනය මේ සමග ඔබ වෙත එවා ඇත. කරුණාකර එම සියළු ම දරු දැරියන් පෞද්ගලිකව ම දැනුම්වත් කර ඔවුන්ගේ සහභාගිත්වය අනිවාර්යෙන් සනාථ කළ යුතු ය.

ලියාපදිංචිය

ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී ලියාපදිංචිය සිදු වන අතර, ලියාපදිංචි ගාස්තු ලෙස එක් බාලදක්ෂයකුගෙන් රු. 500/= **ක මුදලක් අය කරනු ලබන බව දන්වා සිටිමු.**

එමෙන් ම තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම් පත රැගෙන ඒම අනිවාර්ය වේ.

පැවැත්වෙන ස්ථානය

ජාතික බාලදක්ෂ මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී.

පැවැත්වෙන දිනය සහ වේලාව

2026 අගෝස්තු මස 01 වන සෙනසුරාදා ප.ව. 3.00 ට.

ආසන පැනවීම

ලියාපදිංචිය සිදුවන අවස්ථාවේ දී ප්‍රදානලාභීන් වෙත ලබා දෙනු ලබන අංකය අනුව අසුන් ගත යුතු ය.

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Tel : + 94 112 433131 /+94 112 433512
FAX : + 94 112 433131
E -mail : slsaheadq@gmail.com
web : www.scout.lk

පහත සඳහන් ගූගල් පෝරමය සම්පූර්ණ කර 2026 ජූලි මස 25 වන දිනට පෙර එවිය යුතු බව අවධාරණයෙන් දන්වා සිටිමු.

https://forms.gle/Noo3QdX8jojtXxs99

මෙම ලිපියේ සඳහන් කරුණු පිළිබඳව ඔබ දිසාවේ සියළු ම ජනාධිපති ප්‍රදානලාභීන් දැනුම්වත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමු.

ස්තූතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

ගීත් රමේෂ්
ජාතික වැඩසටහන් කොමසාරිස්

නීතිඥ මනෝජ් නානායක්කාර
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

පිටපත් -

1. මූලස්ථානයේ සියළු ම කොමසාරිස්වරුන්
2. ගරු සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාරික
3. කාර්යාලීය ලිපි ගොනුවට